## වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 1 දරණ වයඹ පළාතේ පළාත් පාලන ආයතන (පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල) පිළිබඳ ප්‍රඥප්තිය .

( ආණ්ඩුකාරවරයා අනුමැතිය දුන් දිනය - 1990.05.29 )

වයඹ පළාත තුළ ස්ථාපිත පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමට අදාළව වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා වෙත ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමට විධිවිධාන සැලසීම සඳහා සහ ඊට අදාළ වූ හෝ ආනුෂංගික වූ හෝ කරුණු පිළිබඳව විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**කෙටි නාමය හා ක්‍රියාත්මක වන දිනය.**

1. මෙම ප්‍රඥප්තිය " වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 1 දරණ වයඹ පළාතේ පළාත් පාලන ආයතන (පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල) පිළිබඳ ප්‍රඥප්තිය " යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ දිනයේ සිට ක්‍රියාත්මක වන්නේ ය.

**අදක්ෂතාව ආදිය නිසා සභාව විසුරුවා හැරීමට අමාත්‍යවරයාට ඇති බලය.**

2. (1) I කවර අවස්ථාවකදී වුවද ,

(අ) අවස්ථාවෝචිත පරිදි නගරාධිපතිවරයාගේ නැතහොත් සභාපතිවරයාගේ හෝ යම් පළාත් පාලන ආයතනයක හෝ පළාත් පාලන ආයතනයක යම් සභිකයෙකුගේ හෝ අදක්ෂතාව සහ නොමනා පාලනය ; හෝ

(ආ) අදාළ නීතියක් මගින් නැතහොත් වෙනයම් ලිඛිත නීතියක් මගින් නියම වී ඇති කාර්ය ඉටු කිරීම අවස්ථාවෝචිත පරිදි නගරාධිපතිවරයා නැතහොත් සභාපතිවරයා විසින් හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු විසින් හෝ නිරතුරුවම පැහැර හැර තිබීම ; හෝ

(ඇ) නීතියේ විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කිරීම අවස්ථාවෝචිත පරිදි නගරාධිපතිවරයා නැතහොත් සභාපතිවරයා හෝ යම් පළාත් පාලන ආයතනයක් හෝ එබඳු පළාත් පාලන ආයතනයක යම් සභිකයෙකු හෝ නිරතුරුවම ප්‍රතික්ෂේප කර තිබීම හෝ නොසලකා හැර තිබීම ; හෝ

(ඈ) අදාළ නීතිය මගින් නැතහොත් වෙනයම් ලිඛිත නීතියක් මගින් පිරිනමා ඇති බලතල කිසිවක් අවස්ථාවෝචිත පරිදි නගරාධිපතිවරයා නැතහොත් සභාපතිවරයා විසින් හෝ යම් පළාත් පාලන ආයතනයක් විසින් හෝ එබඳු පළාත් පාලන ආයතනයක යම් සභිකයෙකු විසින් හෝ අනිසි ලෙස නොදැක්වා තිබීම ; හෝ

(ඉ) රැස්වීම් පැවැත්වීම හෝ රැස්වීම් වලට පැමිණ සිටීම හෝ පවත්වන ලද රැස්වීමකදී ඡන්දය පාවිච්චි කිරීම හෝ රැස්වීමේ කටයුතු කිරීම හෝ අවස්ථාවෝචිත පරිදි නගරාධිපතිවරයා නැතහොත් සභාපතිවරයා විසින් හෝ යම් පළාත් පාලන ආයතනයක් විසින් හෝ එබඳු පළාත් පාලන ආයතනයක යම් සභිකයනු විසින් හෝ නිරතුරුවම ප්‍රතික්ෂේප කර තිබීම; හෝ

පිළිබඳව ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට අමාත්‍යවරයා සෑහීමකට පත්වුවහොත්, ඒ එක් එක් අවස්ථාවට අනුව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් –

I. අවස්ථාවෝචිත පරිදි නගරාධිපතිවරයා නැතහොත් සභාපතිවරයා හෝ ධූරයෙන් පහ කළ හැකිය ;

නැතහොත්

II. සභාවේ සියළුම සභිකයන් හෝ ඔවුන් අතරින් යම් සභිකයෙකු හෝ ධූරයෙන් පහ කළ හැකිය ;

නැතහොත්

III. සභාව විසුරුවා හැරිය හැකිය.

තවද, ඒ නියමය හැකි ඉක්මණින් වයඹ පළාතේ පළාත් සභාව හමුවේ තැබිය යුතුය.

(II) අමාත්‍යවරයා විසින් (I) වන උප වගන්තිය යටතේ නියමයක් කිරීමට පෙර (I) වන උප වගන්තියේ සඳහන් සම්කිසි කාරණයක් සම්බන්ධයෙන් තමා සෑහීමට පත්වීම් වස්, ඒ කාරණය ගැන මාස තුනක් වූ කාලසීමාවක් ඇතුළත පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා විශ්‍රාමලත් අධිකරණ නිලධාරියෙකු පත් කළ යුතුය. එසේ පත් කරනු ලබන නිලධරයාට ඒ පරීක්ෂණයට අදාළව, පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂමක බලතල ඇත්තේ ය.

(III) (අ) යම් කාරණයක් ගැන පරීක්ෂා කිරීම සඳහා අමාත්‍ය වරයා විසින් විශ්‍රාමලත් අධිකරණ නිලධරයෙකු (II) වන උප වගන්තිය යටතේ පත්කරන ලද විටක, අවස්ථාවට අනුව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් -

I. අවස්ථාවෝචිත පරිදි නගරාධිපතිවරයාගේ නැතහොත් සභාපතිවරයාගේ ධූරය තාවකාලිකව නතර කොට, නගරාධිපතිවරයාගේ නැතහොත් සභාපතිවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමටත්, එකී නගරාධිපතිවරයාගේ නැතහොත් සභාපති වරයාගේ කාර්යයන් ඉටු කිරීමටත්, අවස්ථා- වෝචිත පරිදි නියෝජ්‍ය නගරාධිපතිවරයාට නැතහොත් උප සභාපති වරයාට හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ නැතහොත් උප සභාපති වරයාගේ ධූරය හිස් වී ඇති අවස්ථාවක හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ නැතහොත් උප සභාපති වරයාගේ ධූරය තාවකාලිකව නතර කොට ඇති අවස්ථාවක නාගරික කොමසාරිස් වරයාට නැතහොත් ලේකම්වරයාට නැතහොත් වයඹ පළාත් සභාවේ සහකාර පළාත් පාලන කොමසාරිස්වරයෙකුට විධාන කළ හැකිය ;

නැතහොත්

II. යම් සභිකයෙකුගේ ධූරය තාවකාලිකව නතර කළ හැකිය ;

එසේ නැතහොත්

III. සභාව තාවකාලිකව නතර කොට, සභාවේ සහ අවස්ථාවෝචිත පරිදි නගරාධිපතිවරයාගේ නැතහොත් සභාපතිවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමටත්, ඔහුගේ කාර්ය ඉටු කිරීමටත්, අවස්ථාවෝචිත පරිදි නාගරික කොමසාරිස්වරයාට නැතහොත් ලේකම්වරයාට නැතහොත් වයඹ පළාත් සභාවේ සහකාර පළාත් පාලන කොමසාරිස් වරයෙකුට විධාන කළ හැකිය.

(ආ) එසේ (I) II උප වගන්තිය යටතේ පත්කරන ලද නිලධරයාගේ වාර්තාව ලැබුණ පසු, අමාත්‍යවරයා විසින් (I) I වන උප වගන්තිය යටතේ නියමයක් කළ හැකිය, නැතහොත් මෙම උප වගන්තියේ (I) III (අ) ඡේදය යටතේ නියමය, අවලංගු කළ හැකිය.

iv. අමාත්‍යවරයා විසින් (1) 1 වන උප වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් අවස්ථාවෝචිත පරිදි නගරාධිපතිවරයා නැතහොත් සභාපතිවරයා ධූරයෙන් පහ කරනු ලැබූ විටක එකී නගරාධිපතිවරයාගේ නැතහොත් සභාපතිවරයාගේ සභික ධූරයද අවසන් වන අතර, එසේ ඇතිවන පුරප්පාඩුව පිරවීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධාන අදාළ වන්නේ ය.

(2) එවැනිම ආකාරයෙන් පළ කරනු ලබන යම් තදනන්තර නියමයක් මගින්

1. අදාළ නීතිය මගින් හෝ වෙනත් ලිඛිත නීතියකින් සභාව හෝ අවස්ථාවෝචිත පරිදි නගරාධිපතිවරයා නැතහොත් සභාපතිවරයා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ හෝ සතු කරනු ලැබුවාවූද එකී නියමයෙහි හෝ එම නියමය සංශෝධනය කරන ලද වෙනයම් නියමයක හෝ නියම වල දැක්වෙන්නා වූ අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල කාරිය හා කටයුතු සතුව සිටීමටත්, ක්‍රියාත්මක කිරීමටත්, ඉටු කිරීමට සහ කිරීමටත් විශේෂ කොමසාරිස්-වරයෙකු හෝ විශේෂ කොමසාරිස්වරුන් ප්‍රකාශිත කාල සීමාවකට හෝ කලින් කළ වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා විසින් හෝ පත් කරනු ලැබිය හැකිය ; නැතහොත්

II. විසුරුවා හරින ලද සභාව වෙනුවට අදාළ නීතියේ විධිවිධාන වලට අනුකූලව අළුත් සභාවක් සංස්ථාපනය කළයුතු යයි අමාත්‍යවරයා විසින් විධාන කළ හැකිය.

(3) මේ වගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයකම එම නියමය බලාත්මක කිරීමේ කාරියය සඳහා අවශ්‍ය විය හැකි විධාන ඇතුළත් විය යුතු අතර, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ විට එයට නීතියේ බලය ඇති විය යුතුය.

(4) සභාව විසුරුවා හැරීමෙන් පසු සහ (2) වන උප වගන්තිය යටතේ විශේෂ කොමසාරිස්වරයෙකු හෝ විශේෂ කොමසාරිස්වරුන් පත් කිරීමෙන් පසු කවර විටක වුවද, විසුරුවා හරින ලද සභාව වෙනුවට අදාළ නීතියේ විධිවිධාන වලට අනුකූලව එම පළාත් පාලන ආයතන ප්‍රදේශය සඳහා අළුත් සභාවක් සංස්ථාපනය කළයුතු යයි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් විධාන කළ හැකිය.

05(...

(5) මේ වගන්තිය මගින් පිරි නමන ලද බලතල ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, සභාව විසුරුවා හැරීමේ සිට විශේෂ කොමසාරිස්වරයෙකු නැතහොත් විශේෂ කොමසාරිස්වරුන් පත් කිරීම හෝ අළුත් සභාවක් සංස්ථාපනය කිරීම දක්වා හෝ පත් කරන ලද විශේෂ කොමසාරිස්වරයා හෝ, විශේස කොමසාරිස් වරුන් ධුරය දැරීම අවසන් වීමේ සිට අළුත් සභාවක් සංස්ථාපනය කිරීම දක්වා යම් කාලයක් ගතවීම අවශ්‍ය වන කවර අවස්ථාවක දී වුවද, ඒ කාලය තුළදී -

(I) අදාළ නීතිය මගින් හෝ වෙන යම් ලිඛිත නීතියකින්, සභාව අවස්ථාවෝචිත පරිදි නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා නැතහොත් සභාපතිවරයා හෝ උප සභාපතිවරයා වෙත පැවරුණු හෝ පිරිනැමුණු හෝ නියම කෙරුණු සියළුම අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල කාර්යය සහ කර්තව්‍ය නාගරික කොමසාරිස්වරයා නොහොත් ලේකම්වරයා හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වයඹ පළාත් සභාවේ සහකාර පළාත් පාලන කොමසාරිස් වරයා හෝ සතුවිය යුතු අතර, ඔහු විසින් ඒවා ක්‍රියාවේ යෙදවීමද, ඉටු කිරීමද, සිදුකිරීම ද කළ යුතුය. තවද,

(II) අවස්ථාවෝචිත පරිදි නාගරික කොමසාරිස්වරයා නොහොත් ලේකම්වරයා හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වයඹ පළාත් සභාවේ පළාත් පාලන සහකාර කොමසාරිස් වරයා, අවස්ථාවෝචිත පරිදි විසුරුවා හරිනු ලැබූ සභාවේ හෝ විශේෂ කොමසාරිස්වරයාගේ හෝ විශේෂ කොමසාරිස්වරුන්ගේ අනුප්‍රාප්තිකයා විය යුතුය.

(6) සභාවක් විසුරුවා හරිනු ලැබූ විට (2) වන උප වගන්තිය යටතේ පත් කරනු ලැබූ විශේෂ කොමසාරිස්වරයා හෝ විශේෂ කොමසාරිස් වරුන් හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වයඹ පළාත් සභාවේ පළාත් පාලන සහකාර කොමසාරිස් වරයා -

(I) පත් කිරීම කරනු ලැබුවේ සභාව විසුරුවා හැරීමෙන් ඉක්බිතිවම නම්, විසුරුවා හරිනු ලැබූ සභාවේ අනුප්‍රාප්තිකයා හෝ අනුප්‍රාප්තිකයන් විය යුතුය.

තවද,

(II) පත්කිරීම කරනු ලැබුවේ (5) වන උප වගන්තියෙහි සඳහන් අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල, කාර්ය සහ කර්තව්‍ය ඒ උප වගන්තිය යටතේ නාගරික කොමසාරිස්වරයා විසින් නැතහොත් ලේකම්වරයා විසින් හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන පළාත් පාලන සහකාර කොමසාරිස් වරයා විසින් ක්‍රියාවේ යෙදවීමෙන්, ඉටු කිරීමෙන් සහ

සිදු කිරීමෙන් පසුව නම්, නාගරික කොමසාරිස් වරයාගේ නැතහොත් ලේකම්වරයාගේ හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වයඹ පළාත් සභාවේ පළාත් පාලන සහකාර කොමසාරිස් වරයාගේ හෝ අනුප්‍රාප්තිකයා හෝ අනුප්‍රාප්තිකයන් විය යුතුය.

**ගිණුම් විගණනය.** 3. (1) සෑම පළාත් පාලන ආයතනයක ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව අදාළ විය යුතුය.

(2) ඒ විගණනයේ වියදම වෙනුවෙන් දායක මුදලක් වශයෙන්, කලින් කල ආණ්ඩුවේ මුදල් විෂය භාර කැබිනට් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන අනුප්‍රමාණයන් මත වූ ගාස්තුවක් සෑම පළාත් පාලන ආයතනයක් විසින්ම ආණ්ඩුවට ගෙවිය යුතුය.

(3) මේ වගන්තිය යටතේ පළාත් පාලන ආයතනයක ගිණුම් විගණනය කිරීමේ දී නීතියට පටහැනි සෑම ගිණුම් විෂයයක්ම විගණකාධිපතිවරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු අතර, නීති විරෝධී ගෙවීම් කරන හෝ කිරීමට බලය දෙන තැනැත්තා විෂයෙහි එය අධිභාරයක් කළයුතුය. තවද, යම් තැනැත්තෙකුගේ නොසැලකිල්ල හෝ විෂමාචාරය නිසා දරණ ලද යම් ඌනතාවක හෝ පාඩුවක මුදලද, තවද ගිණුම් දැක්විය යුතුවූ, එහෙත් එසේ දක්වනු නොලැබූ මුදලද ඒ තැනැත්තාට විරුද්ධව අයකරනු ලැබිය යුතුය. ඒ සෑම අවස්ථාවකදීම ඒ තැනැත්තාගෙන් ලැබිය යුතු මුදල සහතික කරනු ලැබිය යුතු අතර, වයඹ පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා මගින් තම තීරණය ලියවිල්ලකින් ඒ තැනැත්තාට දැනුම් දිය යුතුය. වයඹ පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා විසින් ඒ දැන්වීම ලියාපදිංචි තැපෑලෙන ඒ තැනැත්තා වෙත යැවිය යුතුය. එසේ යවනු ලැබුවහොත් සාමාන්‍ය තැපැල් කටයුතු කිරීමේ දී ඒ තීරණය ඇතුළත් ලිපිය භාරදෙනු ලබන අවස්ථාවේදී ඒ තැනැත්තා විසින් එය භාරගනු ලැබූ ලෙස සැලකිය යුතුය. තවදුරටත් ලිපිය තැපැල්කළ බව ඔප්පු කිරීමට ඒ ලිපියෙහි නිසි ලෙස ලිපිනය ලියා තැපෑලට දැමූ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් වන්නේය.

එසේ වුවද, පළාත් පාලන ආයතනයක් විසින් දරණ ලද වියදම් කිසිවක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ වියදම් වේ නම් විගණකාධිපතිවරයා විසින් ඒවා ප්‍රතික්ෂේප නොකරනු ලැබිය යුතුය.

(4) යම් පළාත් පාලන ආයතනයක යෝජනා සම්මතයකින් බලය දෙනු ලැබූ වියදම් කිසිවකට අදාළ ඒ පළාත් පාලන ආයතනයේ ගිණුම් විෂයයක් මේ වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ නීතියට පටහැනි බැවින් විගණකාධිපතිවරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, ඒ යෝජනා සම්මතයට පක්ෂව ඡන්දය දුන් පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයා නැතහොත් සභාපතිවරයා සහ ඒ පළාත් පාලන ආයතනයේ වෙනත් සෑම සභිකයෙකුම සහ එක් එක් තැනැත්තා ඒ උප වගන්තියේ කාර්යය සඳහා ගෙවීම කළ හෝ ගෙවීම් කිරීමට බලය දුන් තැනැත්තෙකු ලෙස සලකනු ලැබිය යුතුය.

(5) යම් තැනැත්තෙකුට විරුද්ධව යම් අධිභාරයක් හෝ ඉඩ නොදීමක් කිරීමට පෙර ඒ තැනැත්තාට කරුණු ප්‍රකාශ කිරීමට හෝ සුදුසු යයි ඔහු කල්පනා කරන කාරණ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් විගණකාධිපතිවරයා විසින් දෙනු ලැබිය යුතුය. තවද, විගණකාධිපතිවරයා විසින් ඒ අධිභාරය හෝ ඉඩ නොදීම කරනු ලබන අවස්ථාවකදී ඔහුගෙන් ඉල්ලීමක් කරනු ලැබූ විට, ඒ අධිභාරය හෝ ඉඩ නොදීම සම්බන්ධයෙන් තම තීරණය සඳහා හේතු ඒ තැනැත්තා වෙත ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතුය.

(6) (I) යම් අධිභාරයකින් හෝ ඉඩ නොදීමකින් අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින් ඒ තීරණයට විරුද්ධව නිසි බලය ලත් අධිකරණයක් වෙත අභියාචනයක් කළ හැකි අතර එම අධිකරණය විසින් එම අධිභාරය හෝ ඉඩ නොදීම ප්‍රතික්ෂේප කිරීම හෝ ස්ථිර කිරීම කළ හැකිය. නැතහොත් ඒ අධිභාරය හෝ ඉඩ නොදීම නීතියට අනුකූල නොවන බව එම අධිකරණයේ මතය වන්නේ නම් ඒ අධිභාරය හෝ ඉඩ නොදීම ලිහිල් කිරීමට හෝ ඉවත ලීමට හෝ හැකිය.

(II) ඉහත (I) ඡේදය යටතේ වූ සෑම අභියාචනයක්ම නිසි බලය ඇති අධිකරණයක අතුරු ආඥා වලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීමේ දී නියම කොට ඇති සහ අනුගමනය කරනු ලැබිය යුතු රීති වල සඳහන් කාලය ඇතුළතදී එසේ සඳහන් ආකාරයට ඒ රීතිවලට යටත්ව ඉදිරිපත් කිරීමද විභාග කිරීම සහ බලාත්මක කිරීමද කරනු ලැබිය යුතුය.

(7) (I) (6) වන උප වගන්තිය යටතේ වූ අභියාචනයක් වෙනුවට යම් අධිභාරයකින් හෝ ඉඩ නොදීමකින් අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින්, ඔහුට විගණකාධිපතිවරයාගේ තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින 30 ක් ඇතුළත ඒ තීරණයට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනයක් කරනු ලැබිය හැකිය. තවද, එවැනි යම් අභියාචනයක් මත ඒ කාරණයේ කුසලතාවලට අනුකූලව උද්ගත වී ඇති ප්‍රශ්නය අමාත්‍යවරයා විසින් තීරණය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(ii) අධිභාර කරනු ලැබූ හෝ ඉඩ දෙනු නොලැබූ මුදල සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් කොටසක් හෝ එවැනි අභියාචනයක් කරන තැනැත්තාගෙන් අයකර ගැනීම සඳහා හේතු ඇති බව අමාත්‍යවරයා අදහස් කරන්නේ නම් අමාත්‍යවරයා විසින් නියමයක් මගින් එකී තැනැත්තාගෙන් ඒ මුදල අයකර ගැනීමට විධාන කරනු ලැබිය හැකි අතර, යම් අධිභාරයක් හෝ ඉඩ නොදීමක් නීත්‍යනුකූලව කරන ලද්දක් වුව නමුත්, ඊට අදාළ විෂය කාරණ සිදුවූ අවස්ථාගත තත්වයන් අනුව ඒ අධිභාරය හෝ ඉඩ නොදීම ඉවත් කිරීම සාධාරණ සහ යුක්ති සහගත බව අමාත්‍යවරයා නිගමනය කළ විටක, ඔහු විසින් නියමයක් මගින් එය ඉවත් කළයුතු යයිද, එහෙත් අධිභාරය හෝ ඉඩ නොදීම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විගණකාධිපති වරයා විසින් දරණ ලද වියදම් වල හා පිරිවැය වල මුදල් ප්‍රමාණය නැතහොත් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ඉන් යම් කොටසක් ඒ තැනැත්තාගෙන් අයකර ගනු ලැබිය යුතු යයිද, නියමයක් කරනු ලැබිය හැකිය.

(8) ඉහත සඳහන් පරිදි යම් තැනැත්තෙකුගෙන් අයවිය යුතු යයි විගණකාධිපතිවරයා විසින් සහතික කරනු ලැබූ සෑම මුදල් ප්‍රමාණයක්ම ඒ තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තේ නම් මිස විගණකාධිපතිවරයාගේ තීරණය ඒ තැනැත්තා වෙත දැනුම් දෙනු ලැබූ දින සිට දින 30 ක් ඇතුළතදී හෝ වයඹ පළාත් පාලන කොමසාරිස් වරයා විසින් දීර්ඝ කරන ලද වෙනත් කාලසීමාවක් තුළදී ඒ තැනැත්තා විසින් වයඹ පළාතේ පළාත් පාලන කොමසාරිස් වරයා වෙත ගෙවනු ලැබිය යුතුය. තවද, ඒ මුදල් ප්‍රමාණය එසේ ගෙවා නොමැතිනම් සහ අභියාචනයක් ඉදිරිපත් කර නොමැති නම්, ඒ තැනැත්තාගෙන් අය විය යුතු ඒ මුදල් ප්‍රමාණය (9) වන උප වගන්තියේ හෝ (10)වන උප වගන්තියේ සඳහන් ආකාරයට ඒ තැනැත්තාගෙන් අයකර ගැනීම වයඹ පළාතේ පළාත් පාලන කොමසාරිස් වරයාගේ කාර්ය වන්නේය.

(9) (8) වන උප වගන්තියේ සඳහන් යම් මුදලක් ඒ උප වගන්තියේ සඳහන් කාලපරිච්ඡේදය තුළදී ඒ තැනැත්තා විසින් වයඹ පළාතේ පළාත් පාලන කොමසාරිස් වරයාට නොගෙවනු ලැබුවහොත්, ඒ තැනැත්තාගේ නිශ්චල දේපල තහනමට ගෙන විකුණා ඒ මුදල අයකර ගැනීම සඳහා ඉල්ලීමක් නිසි බලය ඇති අධිකරණයක් වෙත එකී කොමසාරිස් වරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, එවැනි ඉල්ලීමක් ලැබුණු විට එකී දේපල තහනමට ගෙන විකුණා, ඒ මුදල අයකර ගැනීම සඳහා රීට් ආඥාවක් ඒ අධිකරණය විසින් පිස්කල්වරයා වෙත නිකුත් කරනු ලැබිය යුතුය. අධිකරණය විසින් නිකුත් කරන ලද

රිට් ආඥාවක් ක්‍රියාත්මක කිරීමෙහිලා පිස්කල්වරයා විසින් නිශ්චල දේපල තහනමට ගෙන විකිණීමට සහ පිස්කල්වරයා විසින් තහනමට ගන්නා ලද නිශ්චල දේපල සම්බන්ධයෙන් හිමිකම් පෑම් ඉදිරිපත් කිරීමට විනිශ්චය කිරීමට අදාළ සිවිල් නඩු විධාන සංග්‍රහයේ එන විධිවිධාන කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමෙහි සඳහන් මුදල් ප්‍රමාණ අයකර ගැනීම සඳහා නිශ්චල දේපල තහනමට ගෙන විකිණීමට සහ එසේ තහනමට ගන්නා ලද දේපල සම්බන්ධයෙන් හිමිකම් පෑම් ඉදිරිපත් කිරීමට හා විනිශ්චය කිරීමට අදාළ විය යුතුය. එකී විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා එසේ සඳහන් කරනු ලබන මුදල් ප්‍රමාණය අධිකරණය විසින් සටහන් කරන ලද තීන්දු ප්‍රකාශයක් අනුව අයවිය යුතු මුදල් ප්‍රමාණයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ කොමසාරිස්වරයා විනිශ්චිත ණය හිමියා ලෙසද එකී මුදල ගෙවීමට යටත් තැනැත්තා විනිශ්චිත ණයකරු ලෙසද සලකනු ලැබිය යුතුය.

(10) (8) වන උප වගන්තියෙහි සඳහන් යම් මුදලක්, යම් තැනැත්තෙකුගේ නිශ්චල දේපල තහනමට ගැනීමෙන් සහ විකිණීමෙන් ඒ තැනැත්තාගෙන් අයකර ගැනීම ප්‍රායෝගික නොවන බව හෝ අයෝග්‍ය වන බව වයඹ පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක හෝ එකී සම්පූර්ණ මුදල එසේ අයකර ගනු නොලැබූ අවස්ථාවක කොමසාරිස්වරයා විසින් එම තැනැත්තාගෙන් අයවිය යුතු මුදල් ප්‍රමාණය සහ එම තැනැත්තාගේ නම සහ ඔහුගේ ව්‍යාපාර ස්ථානය හෝ පදිංචිය පිළිබඳ අවසන් වරට දැන සිටි විස්තර අඩංගු සහතිකයක් නිසි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත නිකුත් කරනු ලැබිය හැකිය. එවිට එම මහේස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාගෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීම සඳහා ඔහුට විරුද්ධව නඩු නොපැවරිය යුත්තේ මන්දැයි හේතු දැක්වීමට ඒ තැනැත්තා තමා ඉදිරියට කැඳවිය යුතුය. තවද, ඒ තැනැත්තා විසින් ප්‍රමාණවත් හේතු නොදැක්වුවහොත් ඒ ලැබිය යුතු මුදල, දඩයකින් පමණක් අඩුවම් කරනු ලැබිය යුතු, නැතහොත් බන්ධනාගාරගත කිරීමෙන් අඩුවම් කළ නොහැකි වරදක් සඳහා ඒ පැහැර හරින්නා මත මහේස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයක් මගින් නියම කරනු ලැබ ඇති දඩයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම දඩය ඒ අනුව අයකර ගනු ලැබිය හැකිය.

(11) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරනු ලැබූ යම් නියමයක් මගින් එවැනි යම් තැනැත්තෙකුගෙන් අයකර ගනු ලැබීමට විධාන කරන ලද යම් මුදලක්, මේ වගන්තියේ විධිවිධාන යටතේ විගණකාධිපතිවරයා විසින් සහතික කරනු ලැබූ යම් මුදලක් අයකර ගනු ලබන ආකාරයටම වයඹ පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා විසින් වහාම අයකර ගනු ලැබිය හැකිය.

(12) මේ වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ නගරාධිපතිවරයා විසින් කරන ලද යම් සහතිකයක හෝ අධිභාරයක හෝ ඉඩ කොදීමක හෝ (7) වන උප වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද නියමයක හෝ (10) වන උප වගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා විසින් දෙන ලද සහතිකය හෝ නිරවද්‍යතාව හෝ වලංගුභාවය මේ වගන්තිය යටතේ ලැබිය යුතු යම් මුදලක් අයකර ගැනීම සඳහා නිසි බලය ඇති අධිකරණයක් ඉදිරියේ දී වූ නඩු කටයුත්තකදී ප්‍රශ්න කරනු නොලැබිය යුතුය.

(13) යම් අධිභාරයක් හෝ ඉඩ කොදීමක් ක්‍රියාත්මක කිරීමේ දී දරණ ලද ගාස්තු හා වියදම් වශයෙන් ගෙවන ලද හෝ අයකර ගන්නා ලද යම් මුදලක් හැර, මේ වගන්තිය යටතේ ගෙවන ලද හෝ අයකර ගන්නා ලද සෑම මුදලක්ම, අදාළ පළාත් පාලන ආයතනයේ අරමුදලට බැර කළ යුතුය.

අනනුකූලතාවයකදී සිංහල පිටපත බලපවත්වන බව.

4. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ හෝ ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල පාඨය බලපැවැත්විය යුතුය.

අර්ථ කථනය.

5. මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා —

" අදාළ නීතිය " යන්නෙන් — මහ නගර සභාවක් සම්බන්ධයෙන් මහ නගර සභා ආඥා පනතද, නගර සභාවක් සම්බන්ධයෙන් නගර සභා ආඥා පනතද, ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතද අදහස් වේ.

" අමාත්‍යවරයා " යන්නෙන් — තත්කාලයේ වයඹ පළාතේ අමාත්‍ය මණ්ඩලයේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා අදහස් වේ.

" නගරාධිපතිවරයා " සහ " නියෝජ්‍ය නගරාධිපතිවරයා " යන යෙදුම් වලින් අදාළ නීතියෙහි එම යෙදුම්වලට දී ඇති අර්ථ කථනය අදහස් වේ.

" නාගරික කොමසාරිස් " යන්නෙන් — අදාළ නීතියෙහි එම යෙදුමට දී ඇති අර්ථ කථනය අදහස් වේ.

" පළාත් පාලන ආයතනය " යනුවෙන් මහ නගර සභාවක්, නගර සභාවක්, ප්‍රාදේශීය සභාවක් හෝ, එම යම් සභාවක කාර්යයන් ඉටු කිරීමට පිහිටුවනු ලැබිය හැකි කිසියම් සභාවක්, ආයතනයක් හෝ මණ්ඩලයක් අදහස් වේ.

" ලේකම් " යන්නෙන් - අදාළ නීතියෙහි එම යෙදුමට දී ඇති අර්ථ කථනය අදහස් වේ.

" විශ්‍රාමලත් අධිකරණ නිලධාරියකු " යන්නෙන් - විශ්‍රාමලත් විනිශ්චයකාරවරයෙකු අදහස් වේ.

" සභාපතිවරයා " සහ " උප සභාපතිවරයා " යන යෙදුම්වලින් අදාළ නීතියෙහි එම යෙදුම්වලට දී ඇති අර්ථ කථනය අදහස් වේ.

ඉ/-